# ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31දිනට ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

| | |
|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 | වැ උඩ, ඊරගම, උස්වැව, ඇලයාපත්තුව, මහියංගනය,යටියන, බිංගිරිය කර්මාන්ත ශාලාවල හා ප්‍රධාන කාර්යාලයේ එකතුව රු. 18,579,229 ක් වූ වාහන, ගෘහ භාණ්ඩ හා උපකරණ, ලිඳ හා ටැංකිය, විදුලි සැපයුම් හා මෙවලම්, උළු අච්චු සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වී තිබුණ නමුත් ප්‍රමිතිය අනුව ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට පළුදු තොග ශේෂයේ එකතුව රු.283,409 ක් වූ අතර මෙම තොග ශේෂය අවසාන ගිණුම් වලින් අත්හැර තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ අවසාන ගිණුම හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ආරම්භක ශේෂයේ එකතුව රු. 25,345,025ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය විසින් පෙර වර්ෂයේ මිලදී ගැනීම් රු.453,199 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ලෙස සටහන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඒරගම කම්හලට අයත් යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම් රු. 187,484ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට ගෙන නොතිබුණි. මෙම අගය 2012 වර්ෂයේ මිල දී ගැනීම් ලෙස සටහන් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී විවිධ ආදායම් යටතේ හඳුනාගත නොහැකි ආදායම් ශේෂය රු.50,650 ක් ලාභාලාභ ගිණුමට බැර කර තිබුණි.

1:2:3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ

| | නීති,රීති, රෙගුලාසි ආදයට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1990 දෙසැම්බර් 20 දිනැති අංක පීඊ1/000/පරිත්‍යාග දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය සංස්ථා මණ්ඩල පරිත්‍යාගයක් කරනු ලබන්නේ නම් එහි මුල්‍යමය වටිනාකම නොසලකා කැබිනට් අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව මණ්ඩලයේ කළමනාකරණය විසින් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් පවත්වන ලද පෙර පාසැල් විවිධ ප්‍රසංගය සඳහා පරිත්‍යාග ලෙස රු.20,000 ක් ගෙවා තිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 10 වන වගන්තිය | මණ්ඩලයේ සේවයේ නියුතු සේවකයන් වෙනුවෙන් 2010 ජුලි සිට 2011 දෙසැම්බර් දක්වා දායක මුදල් රු.39,243,295 ක් නියමිත දනට යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදය | (i) සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ අනුමැතිය ලබාගෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |

(ii) රේඛිය අමාත්‍යාංශයේ වියදම් ඊට අදාල සංස්ථා/මණ්ඩල වලින් නොදැරිය යුතුය යන්න සඳහන් කර ඇති නමුත් ඊට පටහැනිව 2011 වර්ෂයේ පවත්වා තිබූ මැයි දින රැලියට සහභාගි වන පිරිසට දිවා ආහාරය සැපයීම වෙනුවෙන් රු.50,040 ක් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2011 අප්‍රේල් 27 දිනැති ලිපියට අනුව මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.104,172,501 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.77,259,222 ක් විය. මේ අනුව පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,913,279 ක පිරිහීමක් දක්නට ලැබුණි.
සමාලෝචිත වර්ෂයේදී ද විකුණුම් පිරිවැය ආවරණය කර ගැනීමට විකුණුම් වටිනාකම ප්‍රමාණවත් නොවීම නිසා දළ අලාභයක් පෙන්නුම් කෙරුණි. මේ අනුව දළ අලාභය රු.86,594,715 ක් වූ අතර ඉකුත් වර්ෂයේ දළ අලාභය රු.55,453,982 ක් විය. දළ අලාභය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී 57% කින් වර්ධනය වී තිබුණි. එසේම පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.34,554,042 කින් හෙවත් 20%කින් අඩු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් උළු කර්මාන්ත ශාලා 8ක් පවතින අතර සමාලෝචිත වර්ෂය තුල දී සියළුම කම්හල් පාඩු ලබමින් පවත්වාගෙන ගොස් තිබුණු අතර කම්හල් වල ලාභාලාභ තත්ත්වය පසුගිය වර්ෂ 5 තුල පහත පරිදි විය.

| උළු කර්මාන්ත ශාලාව | වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය) රුපියල් මිලියන වලින් | | | | |
|---|---|---|---|---|---|
| | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
| | රු. | රු. | රු. | රු. | රු. |
| බංගදෙනිය | (0.48) | (0.96) | (0.43) | (0.15) | (12.44) |
| වැඋඩ | (11.06) | (11.06) | (18.59) | (18.45) | (10.40) |
| ඇලයාපත්තුව | (29.41) | (20.67) | (25.45) | (18.52) | (3.49) |
| බිංගිරිය | (6.84) | (7.47) | (7.39) | (5.66) | (7.04) |
| මහියංගනය | (20.98) | (15.46) | (12.39) | (14.10) | (130.93) |
| යටියන | (14.38) | (12.07) | 12.26 | (11.37) | (12.35) |
| උස්වැව | (17.13) | (13.80) | (14,17) | (10.56) | (2.80) |
| ඊරගම | (4.15) | 3.83 | 20.50 | 26.31 | 30.16 |

(ආ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තු කළ උළු, ගඩොල් හා සෙසු ද්‍රව්‍ය ඒකක ගණන 11,644,890 වු නමුත් තථ්‍ය නිෂ්පාදන ඒකක 4,223,747 ක් වුයෙන් එය ඇස්තමේන්තු ගත නිෂ්පාදනයෙන් 36% ක් විය. එනම් 64% ක ප්‍රමාණයකින් අරමුණ කරා ලඟාවීමට නොහැකි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්ත ශාලා වල ඇස්තමේන්තු ගත විකුණුම් තථ්‍ය විකුණුම් සමඟ සැසඳීමේ දී පහත පරිදි වෙනස්කම් විය.

(i) මණ්ඩලයේ කර්මාන්ත ශාලා 08 න් 07 කම අපේක්ෂිත විකුණුම් සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. සපුරා ගැනීමට නොහැකි වී තිබු ප්‍රතිශතය 36% සිට 86% දක්වා පරාශයක් වී තිබුණි.

(ii) කම්හල් වල විකුණුම් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ කම්හල් 6 කම විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් කිසිවක් නොතිබුණු අතර, ඇලයාපත්තුව කම්හලේ පමණක් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් රු.1,063,243 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී පහත පරිදි මණ්ඩලයේ ලාභලාභ අපේක්ෂා කර තිබුණු නමුත්, තථ්‍ය ලාභලාභ අතර විශාල වෙනස්කම් විය.

(i) මණ්ඩලයට අයත් කර්මාන්තශාලා සියල්ල සමාලෝචිත වර්ෂයේදී අලාභ ලබා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ කම්හල් 05 ක්ම ලාභ අපේක්ෂා කළ නමුත් එම අරමුණ ඉටුකර ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(iii) ඊරගම කම්හල පසුගිය වර්ෂ 05 ක් තුළදීම ලාභයක් පැවති නමුත් සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 4.148 ක අලාභයක් ලබා තිබුණි. මෙය අපේක්ෂිත තත්ත්වය සමඟ සැසඳීමේදී රු. මිලියන 27.674 ක අඩුවීමකි.

3.2 නිරවුල් නොකළ ශේෂ

-------------------------

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු වශයෙන් රු.175,880,949 ක මුදලක් ගිණුම් වල දක්වා තිබුණු අතර පෙර වර්ෂයේ ශේෂය රු.163,811,497 ක් විය. මේවා නිසි පරිදි නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා පිහන් සමාගම වෙනුවෙන් වෙළඳ ණයගැතියන් හා වෙළඳ ණයහිමියන් ලෙසට පිළිවෙලින් රු.22,375,917 ක් හා රු.48,602,070 ක් බැගින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ශේෂයන් පැවතුණි. මෙම සමාගම 2002 වර්ෂයේදී වසා දමා තිබුණු නමුත් මෙම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ කළමනාකරණය විසින් සමාලෝචිත වර්ෂය තුළදී කම්හල් වල එකතුව රු.4,906,258 ක් වූ වගකීම් ලියාහැර තිබුණු නමුත් මේ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) ඊරගම කම්හලේ දැනට සේවයේ නොමැති සේවකයින් 20 දෙනෙකුගේ උත්සව අත්තිකාරම් ශේෂයේ එකතුව රු.12,550 ක් හා සේවකයින් 04 දෙනෙකුගේ උළු ණය ශේෂයේ එකතුව රු.37,684 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) මහියංගනය කම්හලේ 1982-1987 වර්ෂ දක්වා කාලයට අයත් උත්සව අත්තිකාරම් ශේෂයේ එකතුව රු.2,550 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) උස්වැව කම්හලේ සෙවකයින් 13 කගේ උත්සව අත්තිකාරම් ශේෂයේ එකතුව රු.12,480 ක් හා එක් සේවකයෙකුගේ උළු ණය ශේෂය රු.2,998 ක් අයකර ගත නොහැකි වී තිබුණි.

(ඊ) ප්‍රධාන කාර්යාලයේ වෙළඳ ණයගැති ශේෂය වු රු.60,743 ක් 2008 වර්ෂයේ සිටම පැවත එන අතර එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) බංගදෙණිය කම්හල

(i) මෙම කම්හල වසර 10 කට පෙර සිට වසා දමා තිබුණු නමුත් වෙළඳ ණයගැති ශේෂය රු.314,360 ක් හා ලංකා සෙරමික් ලිමිටඩ් වෙතින් අයවිය යුතු ශේෂය රු.1,476,854 ක් සමාලෝචිත වර්ෂය දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේ සිටම පැවත එන එකතුව රු. 13,363,260 බදු, වෙනත් ණයහිමියෝ ගිණුමට බැර කර තිබුණු අතර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) බංගදෙණිය උළු කම්හලේ ගෙවිය යුතු විදුලිය රු.1,058,182 ක් වු අතර 2012 පෙබරවාරි වන විටත් එම මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(iv) බංගදෙනිය උළු කර්මාන්තශාලාව 2003 මාර්තු මස සිට වසා දමා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය වන විටත් රු. 744,165ක් වටිනාකම වූ උළු තොග කම්හල් භූමිය තුල විය. මෙම තොග අලෙවි කිරීමට , වෙන්දේස කිරීමට හෝ ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) බංගදෙනිය උළු කර්මාන්තශාලාව වසර 10 ක පමණ කාලයක් වසා දමා තිබුණු අතර, 2010 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් පිරිවැය එකතුව රු.7,118,370 ක් විය. වසර 07 කට පසුව කම්හලේ පිහිටි සියළුම ගොඩනැගිලි කඩා ඉවත් කර ගැනීම සඳහා ප්‍රසම්පාදන ප්‍රදානය කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම කටයුත්ත ඉටුකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. පසුගිය වර්ෂයේදී ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණු නමුත් මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) ඇලයාපත්තුව කම්හලේ 2008 වර්ෂයට පෙර සිටම පෞද්ගලික ආයතනයක් වෙතින් අයවිය යුතු රු.844,622 ක් සමාලෝචිත වර්ෂය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) ඒරගම කම්හලේ හා ප්‍රධාන කාර්යාලයේ හඳුනා නොගත් තැන්පතු රු.235,067 ක් සමාලෝචිත වර්ෂයේ බැංකු සැසඳුම් ප්‍රකාශන වල දක්වා තිබුණු නමුත් මෙම හඳුනා නොගත් තැන්පතු ශේෂය සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) වැ උඩ කම්හලේ නිෂ්පාදන කටයුතු 2009 පෙබරවාරි 19 දින සිට අත්හිටුවා තිබුණ නමුත් එදිනට පැවති නිමි තොග ශේෂය රු.1,800,775 ක් හා මැටි තොග ශේෂය රු.1,865,620 ක් අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) තොග සමීක්ෂණ වාර්තා අනුව කම්හල්වල 2011 දෙසැම්බර් 31 දිනට දර තොග ශේෂයන් ඉතා සුළු ප්‍රමාණයක් බවත්, සමහර කම්හල්වල දර තොග ශේෂ නොතිබූ බවත් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි.

(ඕ) මණ්ඩලයේ යටියන, මහියංගනය, වැ උඩ, ඇලයාපත්තුව, බිංගිරිය සහ උස්වැව යන කර්මාන්තශාලාවල එකතුව රු. 572,884 ක් වූ තොග අතිරික්තයක් පැවතුණි. මෙම තොග ශේෂයන් ලේඛණ වලට ගෙන නොතිබුණි.

(ක) 2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් තොග ආගණනය කිරීමේදී බිංගිරිය කම්හලේ සහ ප්‍රධාන කාර්යාලයේ එකතුව රු. 30,939 ක් වූ තොග ඌනතාවයක් පැවතුණි. මෙම තොග ඌනතාවයන් සම්බන්ධයෙන් මණ්ඩලය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ග) අකාර්යක්ෂම කළමනාකරණය හේතු කොට ගෙන නඩු ගාස්තු, අධිභාර හා පාඩු සඳහා එකතුව රු. 537,458 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ච) පෞද්ගලික ආයතනයක් විසින් 2010 දෙසැම්බර් 29 දින ඇණවුම් කරන ලද බිම් උළු 4,880 ක් නියමිත පරිදි සැපයීමට නොහැකි වී තිබුණු අතර ඇණවුම් ප්‍රමාණයෙන් බිම් උළු 960 ක් පමණක් සපයා තිබුණි. මෙහිදී එම ආයතනය සති දෙකක් ඇතුළත ඇණවුම සම්පූර්ණ කරන ලෙස මණ්ඩලයට දන්වා තිබුණු නමුත් මාස 02 ක් ගත වුවත් එම භාණ්ඩ සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් ඉතිරි නොසැපයූ භාණ්ඩ වෙනුවෙන් රු.117,660 ක් ආපසු ගෙවීමට සිදු වී තිබුණි.

3.4 හඳුනාගත් පාඩු

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් කර්මාන්තශාලා 06 ක විදුලිය බිල්පත් නියමිත දිනට ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් එකතුව රු.32,873 ක් දඩ පොලී ගෙවා තිබුණි.

(ආ) වැ උඩ, බිංගිරිය හා ඇලයාපත්තුව යන කම්හල් වල සේවයේ නියුතු නිලධාරීන් හට පාරිතෝෂික පනතේ සඳහන් පරිදි නියමිත දිනට පාරිතෝෂික මුදල් ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් පිළිවෙලින් රු.48,912, රු.19,035 ක් හා රු.55,404 ක් අධිභාර ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල පනතේ සඳහන් පරිදි නියමිත දිනට ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් රු.1,700,064 ක අධිභාර ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී බැංකු අයිරා ලබාගැනීම හේතුවෙන් අයිරා පොලි ලෙස එකතුව රු.18,769ක් ගෙවා තිබුණි.

## 3.5 මණ්ඩලයේ පැවැත්ම

මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් පෙන්නුම් කෙරෙන අතර විස්තර පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේදී ආයතනයේ ලාභදායීත්වය සීඝ්‍ර ලෙස පිරිහෙමින් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | අතිරික්තය/(ඌනතාවය) | ලාභදායකත්වය ඉකුත් වර්ෂය සමඟ සැසඳීම වර්ධනය වීම/(හීනවීම) |
|---|---:|---:|
| | රු. | රු. |
| 2007 | (20,429,672) | 5,584,596 |
| 2008 | (42,869,337) | (22,439,665) |
| 2009 | (63,010,358) | (20,141,021) |
| 2010 | (77,259,222) | (14,248,864) |
| 2011 | (104,172,501) | (26,913,279) |

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ලාභදායීත්වයේ පිරිහීම 34.84% විය.

(ආ) වර්ෂ කිහිපයක් තිස්සේ බැංකු අයිරා ශේෂයක් පැවති අතර, සමාලෝචිත වර්ෂයේ එම ශේෂය රු.1,094,525 ක් විය.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයක් නොමැතිව ආයතනය මෙහෙයවීම.

4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

4.1 සංයුක්ත සැලැස්ම

මණ්ඩලය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියල කර තිබුණද එය යාවත්කාලීන කිරීමට පියවර ගෙන නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණු නමුත් එම අරමුණු කරා ලඟා වීමට අපොහොසත් වී තිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.4 ඡේදය ප්‍රකාර මණ්ඩලය තුළ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම ක්‍රියාත්මක නොවන්නේ නම් වහාම එම කමිටු යථා පරිදි පත්කර ඒවා නිතිපතා රැස්වන බව තහවුරු කර එම කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පසු විපරම් කිරීමට පියවර ගතයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර කමිටු රැස්වීම් පැවැත්වීමට මණ්ඩලයේ කළමණාකරණය කටයුතු කර නොතිබුණි.

4.4 අයවැය ලේඛණමය පාලනය

අයවැයගත ආදායම්, වියදම් සහ තථ්‍ය ආදායම්, වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර වෙනසෙහි ප්‍රතිශතය 5% සිට 853% දක්වා පරාසයක පැවතුනි.

4.5 ප්‍රසම්පාදන සැලැස්ම

මණ්ඩලය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) බැංකු ගිණුම් පවත්වාගෙන යාම

(ආ) ආයෝජන

(ඇ) අත්තිකාරම්

(ඈ) ණයගැතියන

(ඉ) කම්හල් පවත්වාගෙන යාම

(ඊ) තොග ලේඛන පවත්වාගෙන යාම